ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ශ්‍රී ලංකා රජය සමඟ ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ ද්විපාර්ශවික සාකච්ඡා ඇරඹේ</u>

ශ්‍රී ලංකා රජය විසින් මෑතකදී කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකා රජය සමඟ ශ්‍රී ලංකාවේ ද්විපාර්ශවික නිල ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් පළමු සාකච්ඡා වටය 2022 සැප්තැම්බර් 16 වන දින කොළඹ දී පැවැත්වීය. ශ්‍රී ලංකාවේ ණය තිරසාරභාවය සඳහා ණයහිමියන්ගේ මූල්‍යන සහතිකය අවශ්‍ය කෙරෙන අතර සුහද අයුරින් පැවති මෙම සාකච්ඡා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තුළින් ශ්‍රී ලංකාවට ගැළපෙන මූල්‍ය පහසුකමක් ලබාගැනීම සඳහා වන සාකච්ඡා කඩිනමින් අවසන් කිරීමට සහ ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉන්දියාවේ සහයෝගය සංකේතවත් කෙරේ. ඉන්දියාව ශ්‍රී ලංකාවේ අදාළ පාර්ශවකරුවන් සමඟ තවදුරටත් සමීපව කටයුතු කරනු ඇත.

කොළඹ
2022 සැප්තැම්බර් 20